④ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1812/29 - 2013 මැයි මස 31 වැනි සිකුරාදා - 2013.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු මැද පළාතේ පළාත් සභාව

2012 අංක 02 දරන උතුරු මැද පළාත් සභාවේ අධ්‍යාපන සංවර්ධන අරමුදල් සංශෝධන ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාතේ පළාත් සභාව විසින් සම්මත කොට 2013 මාර්තු මස 21 වැනි දින උතුරු මැද පළාතේ පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් සහතික කරන ලද පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

ආර්. කේ. ප්‍රේමසිරි,
ලේකම්,
උතුරු මැද පළාතේ පළාත් සභාව.

2013 මැයි මස 22 වැනි දින,
උතුරු මැද පළාතේ පළාත් සභාවේ දී ය.

**2012 අංක 02 දරන උතුරු මැද පළාතේ පළාත් සභාවේ අධ්‍යාපන සංවර්ධන අරමුදල**

***(සංශෝධන) ප්‍රඥප්තිය***

2012 අංක 02 දරන උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදල (සංශෝධන) ප්‍රඥප්තිය 2012 නොවැම්බර් මස 14 දින පැවැත්වූ උතුරු මැද පළාතේ පළාත් සභා රැස්වීමේදී සම්මත වූ බව මෙයින් සහතික කරමි.

ටී. එම්. ආර්. සිරිපාල,
සභාපති,
උතුරු මැද පළාතේ පළාත් සභාව.

2013 මාර්තු මස 11 වැනි දින.

වර්ෂ 2013ක්වූ මාර්තු මස 21 වැනි දින මා විසින් සහතිකය සටහන් කරන ලදී.

කරුණාරත්න දිවුල්ගනේ,
ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත.

1A - PG 001639 — 435 (2013/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උතුරු මැද පළාතේ පළාත් සභාව

උතුරු මැද පළාතේ පළාත් සභාවේ 2012 අංක 02 දරන අධ්‍යාපන සංවර්ධන අරමුදල සංශෝධන ප්‍රඥප්තිය

මෙම ප්‍රඥප්තිය 2003 අංක 05 දරන උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදල ප්‍රඥප්තිය සංශෝධන සඳහා වූ ප්‍රඥප්තියකි.

උතුරු මැද පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬුනාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

01. මෙම ප්‍රඥප්තිය 2012 අංක 02 දරන අධ්‍යාපන සංවර්ධන අරමුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ සහතිකය ලැබීමෙන් අනතුරුව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 04(1) අ, ආ, ඇ, ඈ, ඉ උප වගන්ති සංශෝධනය කිරීම.

02. මුල් ප්‍රඥප්තියේ අංක 04 (1) අ, ආ, ඇ, ඈ, ඉ උප වගන්ති යටතේ සඳහන්ව තිබූ අරමුදලේ පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගේ සංයුතිය පහත සඳහන් ලෙස සංශෝධනය කරනු ලැබේ :-

4. (1) (අ) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ;

(ආ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ;

(ඇ) ප්‍රධාන ලේකම් විසින් පත් කර එවනු ලබන ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයට අදාළ නිලධාරියෙකු ;

(ඈ) අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් තැනැත්තන් දෙදෙනකු.

ප්‍රධාන ප්‍රඥප්තියේ 04(2) වගන්තිය සංශෝධනය කිරීම.

03. මුල් ප්‍රඥප්තියේ 4(2) වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කෙරේ :

4:2 ඉහත 4 වන වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේද යටතේ සාමාජිකයන් නිල බලයෙන් පත්වන අතර (ඈ) ඡේදය යටතේ, අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් වසර 03ක් නොඉක්මවන කාලයකට පත් කරනු ලැබිය හැකිය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 04(5), 04(6) වගන්ති සංශෝධනය කිරීම.

04. මුල් ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ 5 හා 6 උප වගන්ති පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ :

4. (5) අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්, මෙම අරමුදල් පාලක මණ්ඩලයේ සභාපති විය යුතුය.

4. (6) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, මෙම අරමුදල් පාලක මණ්ඩලයේ ලේකම් විය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 06 වගන්තිය සංශෝධනය කිරීම.

05. මුල් ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ "මණ්ඩලය විසින් පිළිගනු ලැබූ බැංකුවක" යන්න "මණ්ඩලය පිළිගනු ලැබූ රාජ්‍ය බැංකුවක" වශයෙන් වෙනස් කෙරේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 07 (ආ) වගන්තිය සංශෝධනය කිරීම.

06. ප්‍රධාන ප්‍රඥප්තියේ 07(ආ) වගන්තියේ "අනුමත කර ගත් රෙගුලාසි අනුව වාරයකට විධිමත්ව තෝරාගත් පාසලක ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා උත්සවයන් පවත්වා ශිෂ්‍යත්ව ලබා දිය යුතුය" යන්න ඉවත් කර ඒ වෙනුවට පහත වගන්ති ආදේශ කෙරේ :

"අනුමත කර ගත් රෙගුලාසි අනුව විධිමත්ව තෝරා ගත් පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහාත්, ඉතාමත් අඩු ආදායම්ලාභී නොවිධිමත්ව අධ්‍යාපනය හදාරන ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහාත් උත්සවයන් පවත්වා ශිෂ්‍යත්ව ලබා දිය යුතුය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 (උ) නව වගන්තිය ඇතුළත් කිරීම.

07. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (ඊ) උපවගන්තිය අවසාන වූ ඉක්බිතිවම 7 (උ) වශයෙන් පහත උපවගන්තිය ඇතුළත් කෙරේ :

7. (උ) උතුරු මැද පළාතේ පෙරපාසල් සංවර්ධනය හා පෙරපාසල්වල දරු දැරියන්ගේ සුභසාධනය සඳහාත්, උතුරු මැද පළාතේ පාසල්වල සංවර්ධනය හා පාසල් දරු දැරියන්ගේ සුභසාධනය

සඳහාත්, පළාතේ පෙරපාසල් හා පාසල්වල පවතින ප්‍රමුඛ, හදිසි හා අත්‍යවශ්‍ය අවශ්‍යතා ඉටුකරලීම සඳහාත්, ඉහත ආයතනවල ඉගෙනුම ලබන මූල්‍ය දුෂ්කරතා ඇති දරු දැරියන්ගේ අධ්‍යාපන සංවර්ධනය සඳහාත් කුමන අයුරින් හෝ කටයුතු කිරීම සඳහා අමාත්‍යවරයාගේ එකඟතාවය මත මූල්‍යාධාර ලබාදීම.

08. ප්‍රධාන ප්‍රඥප්තියේ 08(1) වගන්තියේ සියලුම තැන්හි සඳහන් "ප්‍රධාන අමාත්‍යාංශය" යන්න ඉවත් කර ඒ වෙනුවට "පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය" යන්න ඇතුළත් කෙරේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 08(1) වගන්තිය සංශෝධනය කිරීම.

09. ප්‍රධාන ප්‍රඥප්තියේ 08(4) අ, ආ වගන්ති අවසාන වූ ඉක්බිතිවම 08(5) වශයෙන් පහත වගන්තිය ඇතුළත් කෙරේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 08(5) නව වගන්තිය ඇතුළත් කිරීම.

08. රෝගාතුර වීම නිසා හෝ ලංකාවෙන් බැහැර වීම නිසා හෝ වෙනයම් හේතුවක් නිසා හෝ මණ්ඩලයේ සභාපතිවරයාට හෝ වෙනයම් කවර සාමාජිකයෙකුට ස්වකීය ධූරයේ කාර්යයන් ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වුවහොත් ඒ වෙනුවට වැඩ බැලීම සඳහා අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා විසින් වෙනත් අයකු පත් කරනු ලැබිය හැකිය.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 09 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත වගන්ති ඇතුළත් කෙරේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 09 වගන්තිය සංශෝධනය කිරීම.

09. මණ්ඩලයේ බලතල, කාර්යය සහ කර්තව්‍ය පාවිච්චි කිරීම, සිදු කිරීම සහ ඉටු කිරීම කෙරෙහි බලපාන හෝ ඊට සම්බන්ධ හෝ ඊට අනුප්‍රාප්තික කවර හෝ වුව ද කාරණයක් සම්බන්ධයෙන් අවශ්‍ය යැයි ඇමතිවරයා විසින් සලකනු ලබන රීති ඒ ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා විසින් වරින් වර පනවනු ලැබිය හැකිය.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ සඳහන් "උතුරු මැද ඥාන පාරමිතා අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහනට" අදාළ වූ රෙගුලාසි යටතේ වගන්ති 01, 02, 03 හා ඒ යටතේ ඇති උප වගන්ති සියල්ල ඉවත් කර ඒ වෙනුවට පහත 01, 02, 03, 04, 05 වගන්ති හා උප වගන්ති ඇතුළත් කෙරේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ රෙගුලාසි යටතේ වගන්ති 01, 02, 03 හා ඒ යටතේ ඇති උප වගන්ති සියල්ල ඉවත් කර ඒ වෙනුවට අලුත් 01, 02, 03, 04 05 වගන්ති හා උප වගන්ති ඇතුළත් කිරීම.

රෙගුලාසි

01. ශිෂ්‍යත්ව පිරිනැමීම

ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා, උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදල හා වෙන යම් ආකාරයේ ප්‍රදාන මගින් මුදල් සැපයෙන ස්ථාවර තැන්පතු ගිණුමක් ක්‍රියාත්මක කළ යුතුය. පළාත් අධ්‍යාපන අමාත්‍යවරයාගේ අභිමතය හෝ එකඟතාවය මත පහත සඳහන් රෙගුලාසිවලට අනුකූලව මෙමගින් ශිෂ්‍යත්ව ප්‍රදානය කළ හැකිය. මෙම ස්ථාවර තැන්පතු ගිණුම වසා දැමීම හෝ එහි මුදල් කවර ආකාරයේ හෝ වෙනත් කටයුත්තකට ලබාගැනීම හෝ භාවිත කිරීම කළ හැක්කේ පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් හා එම යෝජනාව උතුරු මැද පළාතේ සභාවේ නොපැමිණි මන්ත්‍රීවරුන්ද ඇතුළත්ව තුනෙන් දෙකක ඡන්දයෙන් සම්මත වීමෙනි.

02. ශිෂ්‍යත්වධාරියකු වීමට තිබිය යුතු මූලික සුදුසුකම්

ශිෂ්‍යත්වධාරියකු වීමට තිබිය යුතු මූලික සුදුසුකම්.

1:1 උතුරු මැද පළාතේ ස්ථිර පදිංචි උතුරු මැද පළාතේ කුමන හෝ රජයේ පාසලක ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකු හෝ ශිෂ්‍යාවක වීම.

1:2 ශිෂ්‍යත්වලාභියාගේ පවුලේ අවම මාසික ආදායම, දරිද්‍රතා මට්ටමද සැලකිල්ලට ගෙන රජය විසින් කලින් කලට අඩු ආදායම්ලාභීන් ලෙස තීරණය කරනු ලබන පවුල්වල ආදායම් මට්ටමේ අගයට, නොවැඩි වන බවට අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරියා විසින් සහතික කළ යුතුය.

1:3 ශිෂ්‍යත්වලාභී ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවගේ මාසික පාසැලට පැමිණීම 80%කට නොඅඩු විය යුතුය.

1:4 වෙනත් ශිෂ්‍යත්ව ආධාර මුදලකින් ප්‍රදාන ලැබෙන්නේ නම් එවැනි ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට මෙම ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු නොලැබේ.

1:5 දෙමාපිය භාරකරු උතුරු මැද පළාතේ ස්ථිර පදිංචි අයකු වීම හා පසුගිය වසර 03ක් අඛණ්ඩව සිටි බවට පදිංචිය තහවුරු කිරීම, භාරකරු යන්නෙන් අදහස් කරන්නේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ භාරකාරත්වය අධිකරණය මඟින් පවරා ඇත්නම් පමණි.

ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා කොන්දේසි.

03. ශිෂ්‍යත්ව ප්‍රදානය

2:1 ශිෂ්‍යත්වලාභී ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාව තම පාසැලේ ඉගෙනුම ලබන බවට විදුහල්පතිවරයා විසින් සහතික කර තිබිය යුතුය.

2:2 ශිෂ්‍යත්වලාභියා ගේ කාර්ය සාධනය පිළිබඳ වාර්තාවක් අරමුදල් මණ්ඩලය විසින් පාසල් වාරයකට වතාවක් බැගින් ලබා ගැනීම.

2:3 ශිෂ්‍යාධාර දෙනු ලබන්නේ මාසිකව වන අතර ශිෂ්‍යත්වලාභියා පදිංචි ස්ථානයට ආසන්නතම තැපැල් කාර්යාලය මඟින් එය ලබා ගැනීමට සැලැස්විය යුතුය.

2:4 අරමුදලේ මූල්‍ය තත්වය අනුව වර්ෂයකට පිරිනමනු ලබන ශිෂ්‍යත්ව සංඛ්‍යාව හා ශිෂ්‍යාධාරයක් සඳහා ගෙවනු ලබන මුදල් ප්‍රමාණය කොපමණ ද යන්න වරින් වර අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය මත කමිටුව විසින් තීරණය කරනු ලැබේ.

2:5 ජාතික හා ජාත්‍යන්තර වශයෙන් විශේෂ කුසලතා දක්වන ශිෂ්‍යයන් දිරිගැන්වීම සඳහා විශේෂ තිළිණ ප්‍රදානය ද මේ සඳහා ඇතුළත් විය යුතුය.

ශිෂ්‍යත්වය අවලංගු කිරීම.

04. ශිෂ්‍යත්වය අවලංගු කිරීම.

3:1 ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ හැසිරීම පැමිණීම කුසලතා පිළිබඳ විදුහල්පති වාර්තාව අසතුටුදායක එකක් වෙයි නම් ඔහුගේ හෝ ඇයගේ ශිෂ්‍යත්වය අවලංගු කරනු ලැබේ.

3:2 සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර තිබීම ශිෂ්‍යත්වය අවලංගු කිරීමට හේතුවේ.

ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානය.

05. ක්‍රීඩා ශිෂ්‍යත්ව

4:1 මෙම මූල්‍යාධාර ලබාදිය යුත්තේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හෝ රේඛීය අමාත්‍යාංශය පිළිගන්නා ක්‍රීඩා සඳහා පමණි.

4:2 අදාළ ක්‍රීඩකයා හෝ ක්‍රීඩිකාව හෝ ක්‍රීඩා කණ්ඩායම උතුරු මැද පළාතේ රජයේ පාසැල් තුළ ඉගෙනුම ලබන පාසැල් ක්‍රීඩක/ක්‍රීඩිකාවන් විය යුතුය. ඒ බව අදාළ පාසැල්වල විදුහල්පතිවරුන් විසින් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් තහවුරු කළ යුතුය.

4:3 එක් එක් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා ක්‍රීඩා කණ්ඩායම් සඳහා ලබා දෙන ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර ප්‍රමාණය හා වටිනාකම අරමුදලේ මූල්‍ය තත්වය සැලකිල්ලට ගනිමින් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය මත කමිටුව විසින් තීරණය කරනු ලැබේ.

4:4 ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ දක්ෂතා දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා ක්‍රීඩා කණ්ඩායම් දිරි ගැන්වීම සඳහා විශේෂ තිළිණ ප්‍රදානය කළ හැකිය.

4:5 අරමුදල් එක්රැස් කිරීම.

(අ) වාර්ෂිකව පළාත් සභා අරමුදලින් කිසියම් මුදලක් ලබා ගැනීම.
(ආ) පරිත්‍යාගශීලීන්ගෙන් ලැබෙන විශේෂ ප්‍රදානයන් ලබා ගැනීම.
(ඇ) පළාත් අධ්‍යාපන සංවර්ධන ලොතරැයියක් සකස් කර එය තුළින් අරමුදල් ශක්තිමත් කිරීමට කටයුතු කිරීම. මෙම ලොතරැයි පතේ මිල අදාළ කාලයේදී ජාතික ලොතරැයි මණ්ඩලය විසින් දෛනිකව අලෙවි කරනු ලබන ලොතරැයි පතක උපරිම වෙළඳපල මිල නොඉක්මවන පරිදි මණ්ඩලය විසින් තීරණය කළ යුතුය.

06 - 223

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.